# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජනවාරි 2018

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

---

**පොදු කරුණු:**

ක්‍රියාවලීන්, පාලනයන් හා විගණනයෙහි (AA34) ස්ව-අධ්‍යයන ග්‍රන්ථය මත පදනම්ව අනිවාර්ය ප්‍රශ්න නවයක් ඇතුළත් විය. මෙහි කාණ්ඩ 3 ක් තිබුණි. A කොටසෙහි එකකට ලකුණු පහ (05) බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න හතරක් අඩංගු විය. B කොටසෙහි එකකට ලකුණු දහය (10) බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනක් අඩංගු වන අතර සහ C කොටසෙහි එකකට ලකුණු විසිපහ (25) බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න දෙකක් අඩංගු විය.

ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්නවලින් වැඩි ප්‍රමාණයක් ස්ව-අධ්‍යයන ග්‍රන්ථය මත පදනම් වූ අතර එහිදී අයදුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම හා එය ප්‍රායෝගික පරිසරයක් තුළ යෙදවීම් පිළිබඳව පරීක්‍ෂා කර තිබුණි. අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන ග්‍රන්ථය මැනවින් හදාරා ඒවා ප්‍රායෝගිකව යෙදීම සම්බන්ධයෙන් වූ පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර සැපයීම සිදුකර තිබුණේ නම් ඔවුන්ට පහසුවෙන්ම මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු මායිමට ළඟා වීමට හැකියාව තිබුණි.

අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් සිටි අතර ඉන් හැඟවෙන්නේ එම අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන ග්‍රන්ථවල ලබා දී ඇති න්‍යායාත්මක දැනුම අධ්‍යයනය කර ඇති බවත් ඒවා අවබෝධ කරගෙන ඇති බවත් ඒවා සැබෑ ව්‍යාපාර හා විගණන පරිසරය තුළ යොදවා ඇති බවත්ය. තවදුරටත්, මෙහිදී අඩු ලකුණු ලබාගත් අයදුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් සිටියහ. ඔවුන්ගේ උත්තර මත පදනම්ව නිරීක්ෂණය වූයේ ඔවුන් ස්ව-අධ්‍යයන ග්‍රන්ථය අධ්‍යයනය කර නොමැති බවත් පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණු වී නොමැති බවත්ය. ඔවුන් එසේ සිදුකර තිබුණේ නම් ඔවුන්ට පහසුවෙන් ලකුණු 50 (පනහක්) ලබාගත හැකිව තිබුණි.

බහුතර අයදුම්කරුවන් සංඛ්‍යාවක් සියලුම ප්‍රශ්න සඳහා උත්තර සපයා ඇත. කෙසේ නමුත් ප්‍රශ්නවල ඇතැම් කොටස් සඳහා උත්තර ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේ පිළිතුරු ලබා නොදුන් ප්‍රශ්න ප්‍රධාන වශයෙන්ම දුර්වල කාල කලමනාකරණය, දැනුම මදි බව, දුර්වල විභාග තාක්‍ෂණික ක්‍රම යනාදිය නිසාවෙන් බව අපි විශ්වාස කරමු. ඉහත කරුණු වලට අමතරව පහත දැක්වෙන නිරීක්‍ෂණයන් ඇගයීම් ක්‍රියාවලිය පුරාවටම දක්නට ලැබුණි.

- විශ්ලේෂණ කුසලතාවල මද බව.
- නොසැලකිලිමත් ලෙස (කියවාගත නොහැකි) අත් අකුරු ලිවීම.
- ඉහළ ලකුණු සහිත ප්‍රශ්නවලට කෙටි උත්තර ලිවීම.
- අඩු ලකුණු සහිත ප්‍රශ්නවලට දීර්ඝ උත්තර ලියා දැක්වීම.
- සිද්ධියේ දී ඇති ගැටළු හඳුනාගෙන ඇති නමුත් ප්‍රශ්නයට අනුකූලවන පරිදි උත්තර ලබා නොදීම.
- උත්තර සැළසුම් කර නොමැති නිසා අදාළ නොමැති උත්තරයකින් අවසාන කිරීම.
- ප්‍රශ්න පත්‍රය අවසානයේ ලබාදී ඇති කළයුතු ක්‍රියා පද අනුගමනය නොකිරීම.

## A - කොටස

**ප්‍රශ්න අංක 01** (වෙන්කළ ලකුණු 05)

**සීමාසහිත ටෙස්ට් සමාගමේ** ව්‍යාපාරයට බලපාන බාහිර පරිසරයේ සංරචක පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා දී තිබූ ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු ප්‍රශ්නය නිවැරදිව තේරුම්ගෙන සතුටුදායක ලකුණු උපයාගැනීම සඳහා නිවැරදි පැහැදිලි උත්තර ලියා තිබුණි. සමස්ත කාර්යසාධනය සතුටුදායක වූ අතර, බොහොමයක් අයදුම්කරුවන් මුළු ලකුණු ලබා තිබුණේය. එහෙත් ඇතැම් අයදුම්කරුවන් සම්බන්ධයක් නැති උත්තර ලියා තිබූ නිසා ලකුණු ලබා නොතිබුණි. එම අයදුම්කරුවන් බාහිර පරිසර සංරචක ලෙස ප්‍රවාහනය, සංයුක්ත පාලනය, ණයහිමියන් සහ ණයගැතියන්, සන්නිවේදන පරිසරය, තත්ත්ව පාලනය ආදිය සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 02** (වෙන්කළ ලකුණු 05)

මෙම ප්‍රශ්නයෙන් සංයුක්ත පාලනය, විශේෂ වශයෙන් විගණන කමිටුවේ සහ වේතන කමිටුවේ කාර්යභාරයන් සම්බන්ධිතව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය වූ අතර, අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු මුළු ලකුණු ලබාගෙන බහුතරය ලකුණු 2 - 3 වැනි සාමාන්‍ය ලකුණු උපයාගෙන තිබුණේය. දී තිබූ උත්තරවලින් බොහොමයක් අසම්පූර්ණ වුවද අදාල නොවන්නාවූද ඒවා විය. තවද, අයදුම්කරුවන්ට විගණන කමිටුවේ සහ වේතන කමිටුවේ කාර්යභාර අතර, වෙනස වෙන්කර ගැනීමට නොහැකිව තිබූ බව පෙනුණි. විගණන කමිටුවේ කාර්යභාරයක් ලෙස බොහෝ දෙනා සඳහන් කර තිබුණේ විගණන වාර්තා නිකුත් කිරීම, විගණන වාර්තා පිළියෙල කිරීම, විගණන මතයක් ප්‍රකාශ කිරීම, ව්‍යාපාරික සැලසුම් පිළියෙල කිරීම, වැරදි අනාවරණය කිරීම, බාහිර විගණන සිදුකිරීම ආදියයි. වේතන කමිටුවේ කාර්යභාරයක් ලෙස ලාභය සහ වර්ධනය ඇගයීම, බාහිර විගණකගේ වේතන තීරණය කිරීම, සමාගමේ ආදායම විශ්ලේෂණය කිරීම, සේවක වැටුප් නියමිත දිනවල යැවීම ආදිය දක්වා තිබුණේය.

**ප්‍රශ්න අංක 03** (වෙන්කළ ලකුණු 05)

තත්ත්වපාලන පද්ධතියක මූලිකාංග පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා දී තිබූ ප්‍රශ්නයකි. උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණ අතර, අයදුම්කරුවන් සුළු දෙනෙකු පමණක් සම්පූර්ණ ලකුණු ලබා තිබුණි. බොහෝ අයදුම්කරුවන් නිෂ්පාදන ආයතනයක තත්ත්වපාලන පටිපාටි සමග පටලවාගෙන උත්තර ලියා තිබූ අතර, ඒවා සඳහා ලකුණු ලබා දී තිබුණේ නැත. නිරවද්‍යතාව, විශ්වසනීයබව, කාලෝචිත බව, සැසඳියහැකි බව, නිමිභාණ්ඩවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම, නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව ප්‍රමිති නියම කිරීම, වැඩ බෙදීම ආදී අදාල නොවන උත්තර සැහෙන ප්‍රමාණයක් තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග වශයෙන් ලියා තිබුණේය.

**ප්‍රශ්න අංක 04** (වෙන්කළ ලකුණු 05)

සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සඳහා උදාහරණයක් දැක්වීම (a) කොටසින්ද, සීමිත සහතිකවීමේ කාර්යභාරයකදී වෘත්තියේ යෙදෙන්නෙකු සෘණාත්මක මතයක් ප්‍රකාශ කරනු ලැබීමට හේතුව පැහැදිලි කිරීම (b) කොටසින්ද, වශයෙන් කොටස් දෙකකින් මෙම ප්‍රශ්නය සමන්විත විය. අයදුම්කරුවන් සියලුදෙනාම වාගේ (a) කොටසට නිවැරදි උත්තර සැලසීම නිසා කාර්යසාධනය සතුටුදායක වුවද, (b) කොටස සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. මෙයට ප්‍රධාන හේතුව වශයෙන් පෙනී යන්නේ අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය නිසිලෙස වටහා නොගැනීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස අදාල නොවන උත්තර සැහෙන ප්‍රමාණයක් ලියා තිබීම සහ ඒ සඳහා ලකුණු නොලැබීමය. දී තිබූ අදාල නොවන උත්තර සඳහා උදාහරණ වන්නේ කාර්යපථය සීමා කිරීම, විගණන සාක්ෂි මදිවීම, බොහෝසෙයින් සාවද්‍ය තොරතුරු පැවතීම, මනුෂ්‍යයන් අතින් සිදුවන වැරදි පැවතීම, විගණනය සඳහා අවශ්‍ය තොරතුරු සේවාදායකයාගේ කාර්යමණ්ඩලය විසින් නොසැපයීම, ආදියයි.

## B - කොටස

**ප්‍රශ්න අංක 05** (වෙන්කල ලකුණු 10)

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත විය. එහි (A) (a) කොටසෙන් විගණන සාක්ෂිවල ප්‍රමාණවත්බව සහ යෝග්‍ය බව යන්නෙන් කුමක් අදහස් කරන්නේදැයි විමසා තිබූ අතර, (A) (b) කොටසෙන් බාහිර සනාථකිරීම, උදාහරණයක් සහිතව පැහැදිලි කිරීම අවශ්‍ය විය.

(A) (a) කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක වූ අතර, අයදුම්කරුවන් බොහොමයක් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් විය. කෙසේවුවද, විගණන අවදානම් මට්ටම, විගණක විසින් භාවිත කළ සියලුම සාක්ෂි, විගණන සාක්ෂි සඳහා අවශ්‍ය ලේඛණ, සාක්ෂි, මුල් සාක්ෂි විය යුතුය. වගකිවයුතු නිළධාරියෙකු විසින් අනුමත කළ යුතුය යනාදි වැරදි උත්තර විගණන සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍ය බව පෙන්වීමට ලියූ අයදුම්කරුවන්ද වූහ.

(A) (b) කොටස සඳහා කාර්යසාධනය සතුටුදායක විය. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු මේ කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් විය. එහෙත් බාහිර සනාථ කිරීම යන පදය පැහැදිලි කිරීම සඳහා තුන්වන පාර්ශවයක් මගින් විගණනය සිදුකර ගැනීම, මුල්‍ය ප්‍රකාශන තුන්වන පාර්ශවයක් මගින් පිළියෙල කර ගැනීම තුන්වන පාර්ශවයක් මගින් තොග සත්‍යාපනය කරවා ගැනීම ආදි අදාල නොවන උත්තරද ලියා තිබුණි.

(B) කොටස යටතේ, සේවකයන්ට ගෙවීම සඳහා නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් විගණකයෙකු ලවා ඇස්තමේන්තු කරවා ගැනීමේ කුඩා ප්‍රමාණයේ සිද්ධි අධ්‍යනයක් දී තිබුණි. විගණකගේ කාර්යභාරය තක්සේරු කිරීම සඳහා ඔහු යොදාගෙන තිබෙන දේවල්වල යෝග්‍ය බව සහ ප්‍රමාණවත් බව මැනීම සඳහා කරුණු දැක්විය යුතුව තිබුණි. ලියා තිබූ උත්තර බොහොමයක් නියමිත ප්‍රමිතියට ළඟාවී නොමැති බැවින් අඩු ලකුණු ලැබී තිබූ බව පෙනුණි. ප්‍රශ්නය හරිහැටි වටහාගත් කීපදෙනෙක් ඉහළ ලකුණු ලබා තිබූ බවද පෙනුණි. විගණක විසින් සියලුම වැඩ සම්පූර්ණ කර තිබේද, විගණකගේ අවංකභාවය පරීක්ෂා කර ඇද්ද වැනි වැරදි උත්තරද ලියා තිබුණි.

**ප්‍රශ්න අංක 06** (වෙන්කල ලකුණු 10)

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වූ අතර, (A) (a) කොටසින් සේවයේ යෙදවීමේ ලිපියක අරමුණ විමසා තිබූ අතර, (A) (b) කොටසින් සේවයේ යෙදවීමේ ලිපියේ කොන්දේසි සංශෝධනය කිරීමට තුඩුදිය හැකි සාධක විමසා තිබුණි. කොටස් දෙකම සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවති අතර, අයදුම්කරුවන් බොහෝ දෙනෙක් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් වූහ. එහෙත් සමහරු සඳහන් කර තිබුණේ සේවයේ යෙදවීමේ ලිපියේ අරමුණු වනුයේ විගණනය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමත් විගණන පටිපාටි දැක්වීමත් සහ විගණන මතයක් ප්‍රකාශ කිරීමත් බවය.

(B) කොටස යටතේ කුඩා ප්‍රමාණයේ සිද්ධි අධ්‍යයනයක් දී තිබුණි. සමාගමක අභ්‍යන්තර පාලනය සමාලෝචනය කිරීම සඳහා එම සමාගමේ ව්‍යවස්ථාපිත විගණනය භාර හවුල්කරුවන් විසින් කරනු ලබන ඉල්ලීම නිසා විගණකගේ ස්වාධීනත්වය කෙරෙහි ඇතිවිය හැකි තර්ජන පැහැදිලි කිරීම අපේක්ෂා කර තිබුණි. මෙම කොටස සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක වන අතර, අයදුම්කරුවන් බොහොමයක් සියලුම තර්ජන සඳහන් කර ඇතත් දී ඇති සිද්ධියේ කරුණු අධ්‍යයනය සම්බන්ධ නොකිරීම නිසා ඉහළ ලකුණු ලබා ගැනීමට අසමත් විය. එහෙත් එයට සම්බන්ධකොට උත්තර ලියූ අයදුම්කරුවන්ට සාධාරණ ලකුණු දී තිබුණි.

**ප්‍රශ්න අංක 07** (වෙන්කල ලකුණු 10)

විගණන වාර්තාව සහ විගණන මතය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්නයකි. විගණකයෙකු විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරන්නේ කුමන අවස්ථාවන්හිදිදැයි (a) කොටසින් විමසා ඇති අතර, (b) (i) කොටසින් විගණන වාර්තාවේ කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීමේ හේතු පැහැදිලි කරන ලෙසත්, (b) (ii) කොටසින් එබඳු අවස්ථා සඳහා උදාහරණ සඳහන් කරන ලෙසත් නියම කර තිබුණි.

අයදුම්කරුවන්ගෙන් බොහොමයක් මෙම (a) කොටසට උත්තර ලියා තිබූ අතර, එයින් සැහෙන ප්‍රමාණයක් නිවැරදි උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබා තිබුණි. එහෙත් ඇතැම් උත්තර අනුව පෙනී ගියේ සමහර අයදුම්කරුවන්ට විකරණය නොකළ මතයක් පිළිබඳ හරි අවබෝධයක් නොතිබූ බවය. එබඳු අය එවැන්නක් ප්‍රකාශ කරන්නේ විෂය පථයේ සීමාකරණයක් ඇතිවිට, යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වූ කළ, කළමනාකරණය සමඟ එකඟ නොවීම් ඇති අවස්ථාවන්හිදි ආදි වශයෙන් වැරදි උත්තර ලියා තිබුණේය.

(b) (i) සහ (ii) කොටස් සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය. යෝග්‍ය උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගත් අයදුම්කරුවන් කිප දෙනෙකු විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය, ප්‍රශ්නය නිසිලෙස අවබෝධ කරගෙන නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස

- කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කරන්නේ විගණන සාක්ෂි නොමැති විට
- විගණක අහිතකර මතයක් හෝ විකරණය කළ මතයක් ප්‍රකාශ කරන්නේ ගිණුම් වාර්තා නොමැතිවිට සහ ප්‍රමාණවත් විගණන සාක්ෂි නොමැතිවිට වැනි වැරදි උත්තරද සපයා තිබුණේය.

## <u>C - කොටස</u>

**ප්‍රශ්න අංක 08** (වෙන්කළ ලකුණු 25)

**A කොටස**

අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනාගැනීම, එම දුර්වලතා පිටුදැකීම සඳහා නිර්දේශ සහ තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් වැනි විවිධ ක්ෂෙත්‍ර පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කළ ප්‍රශ්නයකි. සිද්ධි අධ්‍යයනය මත පාදක වූ උප ප්‍රශ්න 4 ක් මෙම කොටසේ අතුලත් විය. සිද්ධාන්ත මත භාවිතයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් දුර්වල මට්ටමක පැවති බව පෙනුණි. සත්‍ය ව්‍යාපාරික පරිසරයක් සඳහා සිද්ධාන්ත භාවිතය ගැන අයදුම්කරුවන් හට දැනුමක් නැති බවද පෙනී ගියේය. විභාගයට පෙර, පසුගිය ප්‍රශ්නපත්‍රවල තිබූ සමාන ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණුවීමක් නැති බවද වැටහුණි.

**(a)** දී ඇති විකුණුම් ක්‍රියාවලියේ අභ්‍යන්තර දුර්වලතා හඳුනා දැක්වීම අවශ්‍ය විය. අයදුම්කරුවන් බොහොමයක් සිද්ධි අධ්‍යයනය හොඳින් කියවා බලා සතුටුදායක උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් විය. එය ඉතා සරල ප්‍රශ්නයක් විය. සාමාන්‍ය මට්ටමේ අයදුම්කරුවෙකුට ප්‍රශ්නය තුලින්ම අවශ්‍ය කරුණු ලබා ගැනීමට හැකිවන සේ ප්‍රශ්නය සකස්කර තිබුණි. එහෙත් අයදුම්කරුවන් කිප දෙනෙකු ප්‍රශ්නයේ මෙම කොටසට උත්තර ලියා තිබුණේ නැත. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු ප්‍රදර්ශනාගාරය සහ ගබඩාව එකම තැනක ස්ථානගත කිරීම, සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරයෙකු නොමැති වීම, CCTV කැමරා නොමැති වීම, යනාදිය දෙනලද විකුණුම් ක්‍රියාවලියේ ප්‍රධාන දුර්වලතා ලෙස දක්වා තිබුණද, අනෙකුත් තීරණාත්මක පාලන දුර්වලතා නොසලකා හැර තිබුණි.

**(b)** මෙම කොටස ඉහත (a) කොටසට සම්බන්ධ එකක් වන අතර, හඳුනාගනු ලබන දුර්වලතා සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම අපේක්ෂා කර තිබුණි. මේ සඳහා කාර්යසාධනය සතුටුදායක බව පෙනුණ අතර, අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හැකිවිය. එසේවුවද, තීරණාත්මක අභ්‍යන්තර පාලන දුර්වලතා නොදැන සිටීම නිසා ලකුණු ලබාගත නොහැකි වූ අයදුම්කරුවන් සැහෙන ප්‍රමාණයක්ද සිටියේය. ඔවුන් නිර්දේශ ලෙස දක්වා තිබුණේ CCTV කැමරා සවිකිරීම, සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරයෙකු පත් කිරීම, කාර්යාලය සහ ගබඩාව වෙනම තැන්වල ස්ථානගතකිරීම ආදියයි.

**(c) සහ (d) කොටස**

පරිගණකගත තොරතුරු පද්ධතියක තිබිය යුතු තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් විශේෂයෙන් ඉන්වොයිසිකරණය, තොග නඩත්තු සහ වෙනත් මූල්‍ය ක්‍රියාවලි සඳහා ප්‍රශ්නයේ දී තිබෙන සිද්ධි අධ්‍යයනය මත පදනම්ව, පරීක්ෂා කර තිබේ. ප්‍රශ්නයේ මෙම කොටස් සඳහා ලියා ඇති උත්තර සාමාන්‍ය මට්ටමට ද වඩා පහළින් තිබූ අතර, අයදුම්කරුවන්ට ප්‍රශ්නය තේරුම් ගැනීමට අපහසු වූ බවද, අසතුටුදායක උත්තර තිබූ බවද පෙනී ගියේය. (c) කොටසට වැරදි උත්තර සැපයූ අයට (d) කොටසටද ලකුණු ලබාගත නොහැකි විය.

**B කොටස**

සහතිකවීමේ වාර්තාවක් සැපයීම සඳහා බාහිර විගණක විසින් ඉටුකළයුතු සහතිකවීමේ කාර්යභාරයේ ප්‍රධාන මූලිකාංග පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මෙම කොටසින් පරීක්ෂා කර තිබුණි. මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක වූ අතර, අයදුම්කරුවන් බොහොමයකට මුළු ලකුණු ලබාගත හැකි විය. වැරදි උත්තර ලියා ලකුණු කිසිවක් ලබා නොගත් අයදුම්කරුවන්ද විය. කාර්යභාරයේ ප්‍රධාන මූලිකාංග වෙනුවට විගණන ක්‍රියාවලිය, සහතිකවීමේ කාර්යභාර වර්ග ගැන පැහැදිලි කළ අයදුම්කරුවන් ද වූහ.

**ප්‍රශ්න අංක 09** (වෙන්කළ ලකුණු 25)

**(a)** එකිනෙක සඳහා උදාහරණයක් සමඟ අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා සළකා බැලෙන ව්‍යාපාරයේ පොදු ක්ෂේත්‍ර අයදුම්කරුවන් විසින් හඳුනාගැනීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. ඉතා සරල ප්‍රශ්නයක් නිසා මේ සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් තිබුණි. අයදුම්කරුවන් සැහෙන ගණනක් සතුටුදායක ලකුණු ලබා තිබුණි. ප්‍රශ්නය නිසිලෙස වටහා නොගත් අයදුම්කරුවන් කිප දෙනෙකු ස්ථාවර විගණන වැඩ පත්‍රිකා සමාලෝචනය කිරීම වැනි වැරදි උත්තර සපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලියා නොතිබුණි.

**(b)** **සීමාසහිත ටියාරා සමාගමේ** තොගයට සම්බන්ධ කුඩා සිද්ධි අධ්‍යයනයකට අදාල උපකොටස් තුනකින් ප්‍රශ්නය සමන්විත විය.

**(i)** මෙම කොටස යටතේ තොගවලට අදාල අවදානම පිළිබඳ විමසා තිබුණි. මෙම කොටස සඳහා උත්තර සැපයීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නය නිසිලෙස අවබෝධ කරගෙන නොතිබුණි. තොගයට අදාල විගණන අවදානම වෙනුවට, අධික තොග මට්ටම් පවත්වා ගැනීමේ අවදානම, ඇණවුම් විස්තරවලට යොමු නොවී භාණ්ඩ බාර ගැනීමේ අවදානම වැනි තොග පවත්වා ගැනීමේ ව්‍යාපාරික අවදානම් ඔවුන් හඳුනාගෙන තිබුණි. විගණන අවදානම්වලට ඒවා අදාල නොවන බැවින් එම උත්තර සඳහා ලකුණු පිරිනමා නොතිබුණි.

**(ii)** ඉහත (i) යටතේ ගැනෙන විගණන අවදානම් සඳහා ඉටුකළ යුතු විගණන පටිපාටි පිළිබඳව මෙම කොටසෙන් පරීක්ෂා කර තිබුණි. මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනයද සාමාන්‍ය මට්ටමක පැවතුණි. අයදුම්කරුවන් කිප දෙනෙකු පමණක් ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගෙන සතුටුදායක ලකුණු ලබාගෙන තිබුණි. කෙසේවෙතත් අයදුම්කරුවන් බොහෝ දෙනෙකු විගණන අවදානම් සඳහා ඉටුකළ යුතු විගණන පටිපාටි සඳහන් නොකොට ආර්ථික ඇණවුම් ප්‍රමාණ අනුව ඇණවුම් කිරීම, උපරිම තොග මට්ටම් නිතිපතා නියාචනය කිරීම, භාණ්ඩ ලැබීමේ පත්‍රිකා ඇණවුම් විස්තර සමඟ සැසඳීම වැනි විගණන අවදානම් ලිහිල් කිරීමට සම්බන්ධ අභ්‍යන්තර පාලනයන්ට අදාල උත්තර දී තිබුණි. ඒ අනුව ඔවුහු ලකුණු ලබාගැනීමට අසමත් වූහ.

**(iii)** මෙම කොටස යටතේ වර්ෂාවසාන තොගයේ අගය පරීක්ෂා කිරීමට සිදුකළ හැකි වෙනත් තහවුරු කිරීමේ පටිපාටියක් හඳුනා දැක්වීම පිළිබඳව පරීක්ෂා කර තිබුණි. මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවති අතර, අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණක් සතුටුදායක ලකුණු ලබාගෙන තිබුණි. ප්‍රශ්නය නිසිලෙස වටහා නොගත් අයදුම්කරුවන් බොහෝ දෙනෙකු නිතිපතා තොග සත්‍යාපනය කිරීම, සැපයුම්කරුවන්ගෙන් සනාථ කිරීම් කැඳවීම, ආදි අදාල නොවන උත්තර, වර්ෂ අවසාන තොග ශේෂය ඇගයීම සඳහා තහවුරු කිරීමේ පටිපාටි ලෙස දක්වා තිබුණේය.

**(c)** **(i)** "විමසීමට එරෙහිව නිරීක්ෂණය" *(Inquiry Vs Observation)* උදාහරණ සමඟ සැසඳීම මෙම කොටසින් අවශ්‍යකර තිබූ අතර, අයදුම්කරුවන් බොහෝ දෙනෙකුගේ කාර්යසාධනය සතුටුදායක වූ අතර, ඉහළ ලකුණු ලබා තිබුණි. එහෙත් ප්‍රශ්නය තේරුම් නොගෙන සැසඳීම සිදුකිරීමට අපොහොසත්ව වැරදි උත්තර ලියූ අයදුම්කරුවන් ද විය. අදාල පද දෙකේ තේරුම පැහැදිලි නොකර නිරීක්ෂණය විමසීමට වඩා සුදුසුයැයි ලියා තිබූ අවස්ථාද විය. තවද, නිරීක්ෂණයට උදාහරණ ලෙස නිවැරදි ගනුදෙනුකරු වෙත ඉන්වොයිසිය නිකුත් කළ බව සහතික කර ගැනීමට විකුණුම් ඉන්වොයිසිය පරීක්ෂා කළ යුතුව ඇතැයිද, නිවැරදි ගණන ගිණුම්ගත කර ඇත්දැයි බැලිය යුතු යැයිද, බැංකු ශේෂය පරීක්ෂා කිරීමට බැංකු ප්‍රකාශන පරීක්ෂා කළ යුතුව ඇතැයිද, නිරීක්ෂණය සඳහා උදාහරණ ලෙස සඳහන් කර තිබුණේය.

**(ii)** මෙම කොටසින් "නැවත ගණනය කිරීමට එරෙහිව නැවත ඉටු කිරීම" *(Re-calculation Vs Re-performance)* උදාහරණ සමඟ සැසඳීම අවශ්‍ය විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය හොඳින් තිබූ අතර, ඔවුන්ට සතුටුදායක ලකුණු ලබා ගැනීමට හැකි විය. එසේවුවද, "නැවත ගණනය කිරීම සහ නැවත ඉටුකිරීම" අතර වෙනස නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි වූ බැවින් ලකුණු ලබා ගැනීමට නොහැකි වූ බොහෝ අයදුම්කරුවන් ද සිටියේය.

**(d)** දී තිබූ සැපයුම්කරුගේ සැසඳුම් ප්‍රකාශනය මත ඉටු කිරීමට සැළසුම්කරන විගණන පටිපාටි හඳුනා දැක්වීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා පහළින් පැවතුණි. අයදුම්කරුවන් හට ප්‍රායෝගික ගැටළු පිළිබඳ අවබෝධයක් නොතිබූ බවද සතුටුදායක උත්තර ඒ අනුව සපයා ලකුණු ලබාගත නොහැකිවූ බවද පෙනී ගියේය. දී ඇති සැසඳුමේ දක්වා ඇති කරුණුවලට යොමු නොවී භෞතික සත්‍යාපනය සිදු කිරීම, සියලුම ඉන්වොයිසි පරීක්ෂා කිරීම, සියලුම ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම සහ සියලුම ආපසු එවුම් පරීක්ෂා කිරීම වැනි වැරදි උත්තර සැහෙන ගණනක් සපයා තිබුණේය. කෙසේවෙතත්, ඉතාමත් සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් සතුටුදායක උත්තර සපයා මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් වූහ.

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් වර්ෂ 5 ක ප්‍රශ්න වලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නඟා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට එලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍යකරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -